17
පාඩම

# අභිධර්මය - නිවනින් නිවීම

වාණ යනු තෘෂ්ණාවට නමකි. **නිර්වාණ** යනු තෘෂ්ණාවෙන් මිදුනා යන අර්ථය යි. බෞද්ධයන්ගේ ප්‍රාර්ථනාව වන්නේ ද මෙම තත්ත්වයට පත්වීම යි. ''**රාගක්ඛයො නිබ්බාණං**'' ''**දොසක්ඛයො නිබ්බාණං**'' ''**මෝහක්ඛයො නිබ්බාණං**'' යනාදී වශයෙන් රාගය, දෝෂය, මෝහය යන අකුසල මූල ක්‍ෂය කිරීම නිර්වාණය බව බොහෝ සූත්‍ර දේශනාවල දැකිය හැකි ය. මෙම අකුසල මූල ප්‍රහීණ කර නිර්වාණය පසක් කරගන්නේ කෙසේ ද යන්න නිවැරැදි ව දැනගැනීමට අභිධර්මය හැදෑරීම අවශ්‍ය වේ. සිත පියවරින් පියවර අකුසලයෙන් මිදී කුසලයට යොමු කොට නිවන් මග කරා යන ආකාරය චිත්ත චෛතසික කාණ්ඩවලදී මැනවින් දක්වන ලදී.

නිවනේ ඉපදීමක් නැත. මහලුවීමක් මරණයක් නැත. සකස්වීම් නැත. විඳීම් නැත. කොටින්ම සසර පවතින කිසිවක් නැත. සසර විඳින සියල්ල දුකය. නිවන සුවයකි. එය සුවයක් වන්නේ මේ කිසි දුකක් නැති නිසා ය. නිවන් දකින්නේ රහත්වීමෙනි. රහත්වීම යනු කුමක්ද?

**ඛීණං පුරාණං** - සසර නැවත නැවත ඉපදීමට හේතුවන පැරණි කර්ම අවසන් කරන ලදි. **නවං නත්ථි සම්භවං** - නැවත කර්ම රැස්කිරීමක් ද නැත. **ආයතිකෙ භවස්මිං විරත්ත චිත්තා** - නැවත ඉපදීමේ ඇල්මක් ද නැත. **ඛීණ බීජා** - ඉපදීමේ බීජ ශක්තිය නැසූ **අවිරූළ්හිච්ඡන්දා** - නැවත ඉපදීමේ ආසාවක් ද නැති. **තෙ ධීරා** - ඒ උතුමෝ **යථා අයං පදීපො** - මේ පහන නිවී යන්නා සේ **නිබ්බන්ති** - මෙහිදීම නිවී යති.

**දීපො යථා නිර්වෘති මභ්‍යුපෙතො - නෛයවාවනිං ගච්ඡති නාන්තරීක්ෂම්**
**දිසං න කාඤ්චිත් විදිසං න කාඤ්චිත් - ස්නෙහක්ෂයා කෙවලමෙති ශාන්තිම්**

පහනක් නිවී යන විට එහි ආලෝකය පොළොවට නොයයි. අහසටද නොයයි. දිසා අනුදිසාවලට ද නොයයි. හුදෙක් (ස්නේහ) තෙල් සිඳීමෙන් එතැනම නිවී යයි.

එසේම කෙලෙසුන් නැසූ රහතන් වහන්සේ ද පරලොව කිසිතැනකට නොයති. (ස්නේහ) නැවත ඉපදීමේ තෘෂ්ණාව සිඳීමෙන් මෙහිදීම නිවී යති. මේ අනුව නිවන යනු තවත් උපදින තැනක් නොව මෙහිදීම නූපදින බවට පත්වීම යි.

## 01. සෝපධිසේස නිර්වාණය

පරිනිර්වාණය දෙයාකාරය. සෝපධිසේස හා නිරුපධිසේස යනුවෙනි. උපධි යනු පඤ්චස්කන්ධය යි. යම් කෙනෙකු ජීවත්ව සිටියදී රහත්වීම සෝපධිසේස පරිනිර්වාණය නම්. බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය සෝපධිසේස පරිනිර්වාණය යි. එය ක්ලේශ පරිනිර්වාණය නමින්ද හැඳින්වේ. උන්වහන්සේලා එතැන්සිට සිරුර පවතින තුරු කර්මානු

රූපව පැමිණෙන සැපඳුක් විඳිමින් වෙසෙති. ඉතා යහපත් ජීවිතයක් ගතකරන නමුත් අකුසලයක් තබා කුසලයක්වත් රැස් නොකරති.

### 02. අනුපධිසේස නිර්වාණය

රහතන් වහන්සේගේ මරණය හෙවත් පිරිනිවන් පෑම අනුපධිසේස පරිනිර්වාණය යනුවෙන් හැඳින්වේ. පඤ්චස්කන්ධයෙන් සදහටම මිදුණු හෙයිනි. එය ස්කන්ධ පරිනිර්වාණය නමින් ද හැඳින්වේ.

සෝපදිසේස නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරගත හැකි ආකාර තුනකි.

**01. සම්මා සම්බුද්ධත්‍වයට පත්වීම**
**02. පසේ බුද්ධත්‍වයට පත්වීම**
**03. අරහත්වයට පත්වීම**

යනුවෙනි.

### 01. සම්මා සම්බුද්ධත්‍වයට පත්වීම

බොහෝ කාලයක් සසර දස පාරමිතා, දස උපපාරමිතා, දස පරමත්ථ පාරමිතා යන පාරමිතා ධර්ම තිහක් සම්පූර්ණ අනුන්ගෙන් උපදෙසකින් තොරව කොට තමා ම ධර්මය අවබෝධ කරගෙන අන්‍යයන්ටත් ඒ ධර්මය අවබෝධ කිරීම සම්මා සම්බුද්ධත්වයේ ඇති විශේෂ ලක්‍ෂණය යි. අප තථාගතයන් වහන්සේ එදා සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට ඉන් අනතුරුව මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ ගමන් කොට සොයාගත්තේ ඒ මෙම සම්බුද්ධත්වය යි. ''පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු'' සසරින් සත්ත්වයන් එතර කිරීමේ මාර්ගය යි. ''චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි'' යනාදී වශයෙන් වදාළේ මෙතෙක් තමා කිසිදා කිසිවෙකුගෙන් අසා තිබේ. දුක්ඛ, සමුදය, නිරොධ මග්ග සහ සතර ධර්ම පිළිබඳ අවබෝධය තමාට ඉබේම පහළ වූ බවය. සම්මා සම්බුදුරදුන්ගේ සුවිශේෂතාවය නම් තුන්ලොව සියලු ධර්මයන් සෑම අයුරකින්ම අවබෝධ කිරීමයි. එයට සර්වඥතාඥානය යැයි කියනු ලැබේ. එසේම උන්වහන්සේ සියලු බලයන්හි වසීභාවයට පත්ව සිටි සේක. එනම් කාය බල, ඤාණ බල යන මේ සියලු බලයන්ගෙන් මිනිසුන් දෙවියන් බඹුන් අභිබවා සිටියහ. ඕනෑම කෙනෙකු හමුවේ ඒ බලය යෙදීමේ ශක්තිය උන්වහන්සේට හැර තුන්ලොව කිසිවෙකුට නැත. මා ගඟෙන් එගොඩට විසිකරන්නට සමතෙක් තුන්ලොවම නැත. ඕනම ප්‍රශ්නයක් අසන්නැයි ආලවකට වදාළේ එහෙයිනි.

### 02. පච්චෙක බුද්ධත්‍වයට පත්වීම

පසේ බුදුරජාණන් වහන්සේ ද අනුන්ගේ පිහිටක් නැතිව තමන් වහන්සේ ම චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරන සේක. කෙලෙසුන් නසන සේක. උන්වහන්සේට සර්වඥතාඥානය හෝ බලයන් හා වසීභාවය හෝ නැත. එහෙයින් උන්වහන්සේලා අනුන්ට ධර්මාවබෝධ කරවීමට සමත් නොවෙති. සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් වැඩ

සිටින කාලයට පසේ බුදුරජාණන් වහන්සේලා පහළ නොවන බව ධර්මයෙහි සඳහන් වේ. එය ලෝක ධර්මතාවකි. අප ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ දිනයේ මාතංග නම් පසේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ බව සඳහන් වේ.

## 03. අරහත්වයට පත්වීම

තමාට තනිවම ධර්මය අවබෝධ කරගැනීමට හැකියාවක් නොමැති ශ්‍රාවකයන් වහන්සේලා සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු හෝ දෙසූ දහම අසා ධර්මය අවබෝධ කරගනී. රහතන් වහන්සේට ද අන්‍යන්ට දහම් දෙසා අනුන් ද එය අවබෝධ කරවීමේ හැකියාව ඇත. එහි අරහත්වය කරා පැමිණීමේ පියවර සතරකි. සෝවාන්, සකගාමි, අනාගාමි, අරහත් වශයෙනි. සසර පෙරුමන් පුරා පුරුදු ළ ආකාරය අනුව කෙනෙක් එක්වරම රහත් වෙති. සමහරු සෝවාන් ආදි මගපල පිළිවෙලින් ගොස් රහත් වෙති. මුලින්ම සකගාමි හෝ අනාගාමි වී රහත් වන අයද වෙති.

## 01. සෝවාන්වීම

නිවන් මගෙහි පළමු පියවර සෝවාන් වීම යි. නිවනට අනිවාර්යයෙන් පමුණුවන හෙයින් එසේ දියුණු කළ ආර්ය අෂ්ටාංගික මාර්ගය සෝත නම් වේ. එය සැඩ පහරක් සේ ගමන් කරන හෙයින් ඒ නම යෙදේ. සැඩපහරකට හසු වූ දෙයක් එක එල්ලේ ම ගඟට හෝ මුහුදට ගසාගෙන යයි. එසේ ම සෝවාන් මාර්ගයට පැමිණි පුද්ගලයා අනිවාර්යයෙන් ම නිවනට ළඟා වේ. ''නියතො සම්බොධි පරායණො'' යනුවෙන් ඒ බව දක්වා තිබේ. සෝවාන් මාර්ගය සත්ත්වයා සසර බැඳ තබන දස සංයෝජන අතුරින් සක්කාය දිට්ඨි (ආත්ම දෘෂ්ටිය) විචිකිච්ඡා (සැකය) සීලබ්බත පරාමාස (විවිධ නිෂ්ඵල සිල්ව්‍රත අනුගමනය කිරීම) යන සංයෝජන තුන මුළුමනින් ම නසා දමයි.

සෝවාන් ඵලයට පත් වූ තැනැත්තා නැවත කිසිදාක අපාගාමී වීමක් නැත. මෙලොව දී ම රහත් නොවූයේ නම් ජන්ම සතක් ඇතුළත රහත් වන්නේ ය. එයින් දෙවන ජන්මයේ රහත්වන පුද්ගලයා ඒක බීජී නමින් ද, සත්වන ජන්මයෙහි රහත්වන්නා සත්තක්ඛත්තු පරම යැයි ද ඒ අතරතුර රහත් වන්නා **කෝළං කෝළ** යැයි ද හඳුන්වනු ලැබේ.

## 02. සකදාගාමි වීම

නිවන් මගෙහි දෙවන පියවර සකදාගාමී වීම යි. සකිං + ආගාමි යන්න සකදාගාමී නම් වී ඇත. එනම් එක් වරක් පමණක් එන්නේ ය යන අදහස යි. මෙම දෙවන මාර්ගයට පත් වූ පුද්ගලයා මියගොස් නැවත කාම ස්වර්ගයකට එන්නේ නම් ඒ එක්වරක් පමණි. ඉන්පසු පිරිනිවන් පාන්නේ ය. සකදාගාමි පුද්ගලයා කාමරාගය හා පටිඝය හෙවත් ද්වේශය යන සංයෝජන දෙක තුනී කරන්නේ ය. බල බිඳින්නේ ය. සකදාගාමී පුද්ගලයා එක්වරක් පමණක් මනුලොවට නැවත එන්නේ කාමරාගය මුළුමනින් සිඳ නොදැමූ නිසා ය. එවැනි සකදාගාමී පුද්ගලයන් පස්දෙනෙකු පිළිබඳව විශුද්ධි මාර්ගයේ සඳහන් වේ.

01. මෙලොව සකදාගාමී ඵලයට පැමිණ මෙලොව දී ම රහත්ව පිරිනිවන්පාන තැනැත්තා.
02. මෙලොව සකදාගාමී ඵලයට පැමිණ දෙව් ලොව දී පිරිනිවන්පාන තැනැත්තා.
03. දෙව්ලොව දී සකදාගාමී ඵලයට පැමිණ දෙව්ලොව දී ම පිරිනිවන්පාන තැනැත්තා.
04. දෙව්ලොව දී සකදාගාමී ඵලයට පැමිණ මෙලොවට පැමිණ පිරිනිවන්පාන තැනැත්තා.
05. මෙලොව දී සකදාගාමීව දෙව්ලොව ඉපිද ආයු ඇතිතාක් සිට නැවත මෙ මිනිස් ලොවට පැමිණ පිරිනිවන්පාන තැනැත්තා.

### 03. අනාගාමී වීම

නිවන් මගෙහි තෙවන පියවර අනාගාමී වීම යි. අනාගාමී යනු න + ආගාමී හෙවත් නො එන්නේ ය යන අදහස යි. මේ මාර්ගයට පත් වූ පුද්ගලයා රහත් නොවී කළුරිය කළහොත් නැවත කිසිදාක කාම භවයකට නොඑන්නේ ය. රූප අරූප බ්‍රහ්මලෝක අතරත් උපදින්නේ අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ යන පංච ශුද්ධාවාස බ්‍රහ්මලෝකවල පමණි. එහි ඉපිද එහි දී ම පිරිනිවන් පාන්නේ ය. එසේ සිදුවන්නේ ඒ පුද්ගලයා සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ යන ඕරම්භාගිය සංයෝජන පහ ම සහමුලින් ම සිඳලන බැවිනි. ඕරම්භාගිය යනු කාම භව වශයෙන් සැළකෙන දිව්‍යලෝක හයේ මිනිස් ලොව හා සතර අපායේ ඉපදීමට හේතුවන සංයෝජන යි. මේවා හීන හෙවත් පහත් භව ලෙස සලකන බැවින් **ඕරම්භාගිය** යැයි කියනු ලැබේ. අනාගාමී පුද්ගලයා කිසි දිනක දිව්‍ය මනුෂ්‍ය යන කාම ලෝකයකට පැමිණෙන්නේ නැත.

### 04. රහත් වීම

නිවන් මගෙහි සිව්වන පියවර හෙවත් අවසානය රහත් වීම යි. අරහත් ඵලයට පත්වන උත්තමයන්ට පහළවන සිත අරහත් ඵල සිත යි. මෙම ඵලයට පත්වන උතුමා රූපරාග අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන උද්ධම්භාගිය හෙවත් බ්‍රහ්මලෝකවල ඉපදීමට හේතුවන සංයෝජන පහ ද මුළුමනින් ම සිඳ දමයි. එයින් අදහස් වන්නේ උන්වහන්සේ සංසාරයෙහි ඉපදීමට හේතුවන සියලු සංයෝජන නැසූ බව යි. නැවත උන්වහන්සේගේ ඉපදීමක් නැත.

ඉහත දැක් වූ සම්මා සම්බුද්ධත්වය, පච්චේක බුද්ධත්වය හා අරහත් භාවය යන මාර්ග තුන ඔස්සේ ඕනෑම කෙනෙකුට මෙම සසර දුක් කෙළවර කොට නිර්වාණාවබෝධය ලැබිය හැකි වේ. ඒ සඳහා කළ යුත්තේ අදාළ ආර්ය මාර්ගයේ ගමන් කිරීමයි.

**අභ්‍යාස**

01. බුදු, පසේ බුදු, මහරහත් යන උතුමන් වහන්සේලා අතර පවත්නා වෙනස්කම් මොනවා ද?
02. සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් යන පුද්ගලයන් සිව්දෙනා පිළිබඳ විස්තරයක් කරන්න.